**නිපුණතාවය :-** කුඩා පරිමාණ ව්‍යාපාරයක ව්‍යවසායකයකු විසින් ඉටු කරන භූමිකා විමර්ශණය කරයි.

**නිපුණතා මට්ටම :-** කුඩා පරිමාණ ව්‍යාපාරයක් සාර්ථකව පවත්වාගෙන යාම සඳහා ව්‍යවසායකයකු විසින් වර්ධනය කරගත යුතු කළමනාකරණ සහ නායකත්ව කුසලතා අනාවරණය කරයි.

**( පෙළ පොතේ පිටු අංක 54 සිට 56 දක්වා හොඳින් කියවා පහත ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න)**

(01) ව්‍යවසායකයකුට අයිතිකරුගේ භූමිකාව ,නායකයාගේ භූමිකාව සහ කළමනාකරුගේ භූමිකාව ප්‍රායෝගිකව නිරූපණය කිරීමට විවිධ හැකියා සහ කුසලතා අවශ්‍ය වේ.මෙම වාක්‍යයේ සත්‍යතාවය විමසන්න.

(02) තාක්ෂණික කුසලතා යන්න පැහැදිලි කර තාක්ෂණික කුසලතා ව්‍යවසායකයකුට වැදගත්වන ආකාරය පැහැදිලි කරන්න.

(03) සංවිධානයේ අරමුණු සහ පරමාර්ථ කරා යාමේදී ව්‍යවසායකයකුට මානව කුසලතා වැදගත් වේ.මානව කුසලතා යන්න පැහැදිලි කර ව්‍යවසායකයෙකුට එය වැදගත්වන ආකාරය පැහැදිලි කරන්න.

(04) නායකයකු යනු ස්වාධීනව තීරණ ගන්නා පුද්ගලයකු මිස, අන් අයට ඇහුම්කන් දෙන්නෙකු නොවේ.මෙම ප්‍රකාශයේ සත්‍ය අසත්‍යතාව විමසන්න.

(05) නව නිෂ්පාදන බිහිකිරීම ,නව වෙළඳපල සොයාගැනීම ආදී කාර්යයන් අයත්වන්නේ කුමන කුසලතාවයකට ද ?

(06) සංකල්පනාත්මක කුසලතාවල ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

(07) පහත ප්‍රකාශයන් අතුරෙන් සංකල්පනාත්මක කුසලතාවයකට අයත් නොවන්නේ ,

i. නව නිෂ්පාදිත බිහිකිරීම.
ii. නව උපාය මාර්ග සංවර්ධනය.
iii. තරඟකාරිත්වයට මුහුණදීම.
iv. තොරතුරු විධිමත්ව බෙදාහැරීම.